**කළුතර ප්‍රාදේශීය සභාව - 2022**

**------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කළුතර ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කළුතර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිතයේ පරිච්ඡේද අංක 3.27 සිට 3.32 දක්වා සඳහන් ඡේදයන්ට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කර නොතිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරිමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය. |
| (ආ) | ප්‍රමිතයේ පරිච්ඡේද අංක අංක 6.1 ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණ යටතේ හඳුනාගත යුතු රු.5,447,947 ක් වූ පුස්තකාල පොත් සමාලෝචිත වර්ෂයේද තොග ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේදී තොග ලෙස දැක්වීමට කටයුතු කරන බව | පුස්තකාල පොත් දේපළ, පිරියත හා උපකරණ යටතේ හඳුනා ගත යුතුය. |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයේ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස 2020 හා 2021 වර්ෂවල පිළිවෙලින් රු.89,974,532 ක් හා රු.8,068,780 ක් ලැබී තිබුණද, එම ප්‍රදාන වත්කම් කාණ්ඩය අනුව වර්ග කොට හඳුනා ගෙන ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරිමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | පුනරාවර්තන නොවන වියදම් සඳහා වූ රජයේ ප්‍රාග්ධන ප්‍රදාන නිවැරදිව ගිණුම්ගත කිරිමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතු රු.600,000 ක් වන පුස්තකාල පොත් මිලදී ගැනීම් සමාලෝචිත වර්ෂයේ අයහාර වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරිමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | පුස්තකාල පොත් මිලදී ගැනීම් වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතුය. |

**1.6.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිණුම් විෂයයන් 04 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් හා ඒවාට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.6,751,052 වෙනසක් විය. | ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරන බව | ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගිණුම් විෂයයන් 03 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් හා අදාල ලෙජර් ගිණුම් ශේෂයන් අතර රු.932,336 ක වෙනසක් විය. | -එම- | -එම- |

**1.7 අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (අ) වගන්තිය | වරිපනම් බදු අයකර ගැනීමේ අවසන් පියවර ලෙස දේපළ තහනම් කිරිම කර නොතිබුණි. | මේ වන විට රතු නිවේදන නිකුත් කිරිම ආරම්භ කර ඇති බව | ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2019 දෙසැම්බර් 24 දිනැති අංක 2155/8 දරන ගැසට් පත්‍රයේ රීති අංක 42 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | දේපල සමීක්ෂණය සඳහා කමිටු පත් කර ඇති අතර කඩිනමින් එය අවසන් කිරිමට කටයුතු කරන බව | ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛය | සමාලෝචිත වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | 2023 වර්ෂයේ සිට නිවැරදිව කටයුතු කරන බව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.50,962,414 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ වියදම රු.62,107,295 විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2022 ඇස්තමේන්තුගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස් කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2021 ඇස්තමේන්තු ගත ආදායම | 2021 බිල් කළ ආදායම | 2021 රැස් කළ ආදායම | 2021 දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 9,483,183 | 9,479,741 | 8,537,184 | 12,208,751 | 11,011,441 | 9,472,825 | 5,615,244 | 11,266,194 |
| (ii) | කුලී | 270,000 | 270,000 | 294,500 | - | 1,598,200 | 262,500 | 262,500 | 24,500 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 440,000 | 415,175 | 415,175 | - | 2,064,225 | 1,539,050 | 1,539,050 | - |
| (iv) | වෙනත් ආදායම් | 80,000,000 | 80,000,000 | 54,892,871 | 247,489,769 | 80,000,000 | 80,000,000 | 18,829,361 | 222,382,640 |
| | | 90,193,183 | 90,164,916 | 64,139,730 | 259,698,520 | 94,673,866 | 91,274,375 | 26,246,155 | 233,673,334 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණපහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වරිපනම් බදු කාල විශ්ලේෂණයට අනුව වර්ෂ 01-03 අතර වරිපනම් බදු හිඟය රු.7,165,687 ක් ද, වර්ෂ 03-05 අතර හිඟය රු.2,304,691 ක්ද, වර්ෂ 05-09 අතර හිඟය රු.1,779,522 ක් ද හා වර්ෂ 09 යට වැඩි හිඟය රු.539,425 ක් ද විය. | ඉදිරියේදී දේපල තහනම් කර හිඟ බදු අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව | හිඟ ආදායම් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.60,000,000 ක් හා මුද්දර ගාස්තු රු.197,404,504 ක් විය. | 2019 වර්ෂයට අදාල මුදල් වලින් කොටසක් ලැබී ඇති අතර 2020 වර්ෂයට අදාල උපලේඛන සකස් කර පළාත් ආදායම් කොමසාරිස් වෙත යොමු කර ඇති බව | ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගබඩාවේ පැවති වටිනාකම රු.389,670 ක් වූ තොග අයිතම 27 ක් වර්ෂ 08 ක කාලයක සිට නිශ්කාර්යව පැවතුණි. | කෘමි නාශක දියර කල් ඉකුත් වී ඇති අතර අනෙකුත් උපාංග යොදා ගන්නා උපකරණ භාවිතයේ නොමැති බව. | ගබඩා සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ අනුව කටයුතු කළ යුතුය. |

**3.2 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 1946 අංක 57 දරන පොදු සුසාන හා පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ 10 වගන්තිය ප්‍රකාරව සුසානභූමිවල ආරක්ෂාව සඳහා ආරක්ෂිත වැට මායිම් සකස් කළයුතු වුවත්, සභාව සතු සුසානභූමි 17 ක වැට මායිම් සකස් කර නොතිබුණි. | රජයේ වියදම් කළමනාකරණය හේතුවෙන් වැට මායිම් ඉදි කිරිම සිදු කළ නොහැකි වූ බව | සුසානභූමි ආඥා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) වස්කඩුව ප්‍රාදේශිය සභා පරිපාලනය යටතේ ඇති සුසානභූමි 24 න් සුසානභූමි 21 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සභාව වෙත පවරාගෙන නොතිබුණි. | සුසානභූමිවල අයිතිය පවරා ගැනීම සඳහා නීත්‍යානුකූලව කටයුතු සිදු කරමින් පවතින බව | සුසානභූමි සභාව වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) 2015 ජනවාරි 22 දින බස්නාහිර පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ලබාදී තිබූ ඩබල් කැබ් රථය , සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සභාව නමින් ලියාපදිංචි කර නොතිබුණි. | ප්‍රාදේශිය සභාව වෙත කැබ් රථය පවරා ගැනිමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බව | කැබ් රථය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| උග්ගල්බඩ ගංකන්දගොඩ ප්‍රජා ශාලා ගොඩනැගිල්ලේ අභ්‍යන්තර වෙන් කිරිම් කර්මාන්තයේ ඇළුමිනියම් යොදා ගනිමින් අභ්‍යන්තර වෙන් කිරිම් සිදු කිරිමට වර්ග අඩියකට අදාල අනුමත රේටය රු.1,435 වුවත්, ගෙවීම් කිරිමේදී වර්ග අඩියකට රු.4,561 ක් ලෙස එනම් එක් වර්ග අඩියකට වැඩිපුර රු.3,126 බැගින් වර්ග අඩි 164.34 ක් සඳහා රු.513,727 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | විගණනය මගින් පෙන්වා දී ඇති කරුණු පිළි ගන්නා අතර මේ වන විට වැඩිපුර ගෙවා ඇති මුදල සභා අරමුදලට බැර කර ඇති බව | කොන්ත්‍රාත් සඳහා ගෙවීම් කිරිමේදී නිවැරදි රේටයන් අදාල කර ගත යුතුය. |

### 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වෙතින් වාහන ලියාපදිංචි සහතික අවලංගු කර ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂය තුළ වාහන 10 ක් රු.1,077,973 කට සුන්බුන් ලෙස අලෙවි කර තිබුණි. | ලියාපදිංචිය අවලංගු කල යුතු වාහන සඳහා ලිපි ගොනු කළුතර මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් කාර්යාලය වෙත භාරදී ඇත. | ලියාපදිංචි සහතික අවලංගු කිරිමෙන් පසු වාහන වෙන්දේසි කළ යුතුය. |

### 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

**තිරසාර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී සභා බල ප්‍රදේශය තුළ දිරන කසළ මෙට්‍රික් ටොන් 206,628 ක් සහ නොදිරන කසළ කි.ග්‍රෑ.155,340 ක් රැස් කර තිබුණි. අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන යටතේ දිරන කසළ සඳහා ගෘහස්ථ මට්ටමින් කොම්පොස්ට්කරණ බඳුන් ලබාදීම තිරසර සංවර්ධන සැලැස්මට ඇතුලත් කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළ එය ක්‍රියාත්මක කර නොතිබුණි. | පැවති වසංගත තත්ත්වය හා රජයේ චක්‍රලේඛ අනුව එම වැඩ සටහන ක්‍රියාත්මක කිරිමට නොහැකි වූ බව | තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරිමට කටයුතු කළ යුතුය. |